# නිතර අසන ප්‍රශ්න

ප්‍රශ්නයඃ CDCE එකේ ලියාපදිංචි ශිෂ්‍යයන් හැමදෙනාටම ඊ මේල් එකවුන්ට් එකක් තියෙන්නම ඕනැද?

පිළිතුරඃ ඔව්. අනිවාර්යයි. ඊ මේල් හරහා තමයි ශිෂ්‍යයන්ට පනිවිඩ යැවෙන්නෙ. ඒ විතරක් නෙමෙයි පාඨමාලාවෙ ඉගෙනුම් උපකාරක සටහන් ආදිය යැවෙන්නෙත් අන්තර්ජාලය හරහා. ඒ නිසා ඊමේල් එකවුන්ට් එක වගේම කේන්ද්‍රයේ වෙබ් පිටුවටත් ගිහින් අලුතෙන් දාල තිබෙන දැන්වීම් ආදිය නිතර බලන්න ඕනැ.

ප්‍රඃ පාඨමාලාව කරගෙන යනකොට අසා දැනගත යුතු කරුණක් තිබුණොත් කාගෙන්ද අහන්නෙ?

පිඃ දැනගන්න අවශ්‍ය දේ අනුව කාගෙන්ද අහන්නෙ කියන එක තීරණය වෙනව. පාඨමාලාවෙ නීතිරීති, ගාස්තු, විභාග පැවැත්වෙන දින, ප්‍රතිඵල ගැන, මේ වගේ පාඨමාලා පරිපාලන විමසීම් CDCE එකේ සහකාර ලේඛකාධිකාරිගෙන්, නැති නම් කාර්යාලයේ විෂය භාර නිලධාරියාගෙන් අසා දැනගන්න පුලුවනි. පැමිණ විමසන්නේ නම් පිළිගැනීමේ නිලධාරිනියට කාරණය පැවසූ විට ඇය අදාල පුද්ගලයා මුනගස්සාවි. දුරකථනයෙන් විමසන්නේ නම් පිළිගැනීමේ නිලධාරිනියට කතා කළ විට ඇය ඇමතුම අදාල පුද්ගලයාට යොමු කරාවි. මේ අත්පොතේ අවශ්‍ය දුරකථන අංක සහ ඊමේල් ලිපින තිබෙනව. ඒ හරහා තමන්ට අවශ්‍ය කෙනාව සම්බන්ධ කර ගත හැකියි.

දැනගන්න අවශ්‍ය දේ විෂය නිර්දේශ වගේ පාඨමාලා ඒකක සම්බන්ධ දෙයක් නම් අධ්‍යක්ෂ තුමිය, නියෝජ්‍ය අධ්‍යක්ෂතුමකු හෝ පාඨමාලා සම්බන්ධීකාරක ඇමතීම වඩා හොඳයි. ඒ අයගේ දුරකථන අංක ආදියත් ශිෂ්‍ය අත්පොතේ තියෙනව.

ප්‍රඃ උපාධිය අවසන් කරන්ඩ කොච්චර කාලයක් දෙනවද?

පිඃ පංති සාමර්ථයක් ඇතිව ප්‍රයත්න 03යි. පංති සාමර්ථයක් නැතිව 100 මට්ටමේ ප්‍රයත්න 10 යි. මේ ඔරිජිනල් ප්‍රයත්නය ද ඇතුලත්වයි. ඊට පස්සෙ ඉබේම ශිෂ්‍යභාවය කැන්සල් වෙනව.

පංති සාමර්ථයක් ඇතිව උපාධිය අවසන් කරන්ඩ නම් හැම මට්ටමක්ම (100 - 300) එක පාරෙන් **සමත් වෙන්ඩ** ඕන. (ඌන සාමර්ථයක් තිබුණත් ඇති.) පාඨමාලා ඒකකයකට නැවත පෙනී සිටිනව නම් ඒව ඔක්කොම 300 මට්ටමේ විභාගෙට ලියන විට ඉවර කරන්න ඕනැ. හැබැයි කලා අධ්‍යයන මණ්ඩලයෙන් වෛද්‍ය වැනි හේතු උඩ පන්ති සාමර්ථ සුදුසුකම සහිතව නිවාඩු දී තිබේ නම් උඩින් කියපුව අදාළ නැහැ. එවිට 300 මට්ටමේ විභාගෙන් පස්සෙ තිබෙන විභාගෙත් ප්‍රථම උත්සාහය (නොඉඳුල් උත්සාහය) ලෙසනෙ ගැනෙන්නෙ.

තමන් අයත් ශිෂ්‍ය කණ්ඩායම (බැච් එක) වාඩි වූ පළවෙනි 100 විභාගයේ සිට එය ද ඇතුලත්ව 100 මට්ටමේ විභාග 10ක් පැවැත්වෙන තෙක් ඒ අතර පැවැත්වෙන 100, 200, 300 මට්ටම් විභාගවලට නැවත නැවත පෙනී සිට පන්ති සාමර්ථ නැතිව උපාධිය සමත් වෙන්ඩ පුලුවනි. මේ බව මේ පොතෙහි මේ උද්ධෘතයෙන් කියවෙනව.

**"දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය එක් සුවිශේෂී ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා ආරම්භයේ සිට නිරන්තරයෙන් පවත්වාගෙන එනු ලබන 100 මට්ටමේ විභාග 10කට පසු එම ශිෂ්‍ය කණ්ඩායමට අයත් ශිෂ්‍යයන්ගේ ශිෂ්‍යභාවය ආකස්මිකව අහෝසි වේ."**

ප්‍රඃ තුන්පාරක්ම උත්සාහ කරලත් පදනම් පාඨමාලාවක් සමත් වෙන්ඩ බැරි උනොත් මොකද වෙන්නෙ?

පිඃ උපාධි පාඨමාලාවෙන් ඉවත් වෙන්ඩ සිදුවෙනව.

ප්‍රඃ පාඨමාලා ඒකක තෝරාගැනීමේ දී සැලකිය යුතු කරුණු මොනවාද?

පිඃ පදනම් පාඨමාලා ඒකක තුන හැම කෙනෙක් ම තෝරාගන්න ඕනැ.

අතිරේක පාඨමාලා ඒකක ලෙවල් තුනට වෙන් කරල තියෙන පාඨමාලා ඒකක ලිස්ට් එකෙන් තෝරාගන්න ඕනැ. එතෙන්දි 100 මට්ටමට එකකුත් 200 මට්ටමට 4කුත් 300 මට්ටමට 4කුත් තෝරාගන්න ඕනැ.

ප්‍රධාන විෂය තුනක් තෝරගෙන ඒ තුන මට්ටම් තුනේදි ම කරන්න ඕනැ. එක මට්ටමක දි එක ප්‍රධාන විෂයකින් පාඨමාලා ඒකක දෙක ගණනෙ තෝරගන්නත් ඕනැ. ප්‍රධාන විෂයන් බාස්කට් තුනකට දාල තියෙනව. එක බාස්කට් එකකින් එක විෂය ගානෙ තෝරාගන්න ඕනැ. කොහොම හරි අවසානෙ දි එකිනෙක වෙනස් ප්‍රධාන විෂයන් තුනක් තෝරාගෙන තිබිය යුතුයි.

ප්‍රඃ හැම පාඨමාලා ඒකකයක් ම සිංහල, දෙමල, ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන් ම දෙනවද? දෙන මාධ්‍ය ගැන දැනගන්නෙ කොහොමද?

පිඃ හැම පාඨමාලා ඒකකයක් ම මාධ්‍ය තුනෙන් දෙන්නෙ නැහැ. මේ පොතේ හැම පාඨමාලා ඒකකයක් ම ඉදිරියෙන් S T E කියන ඉංග්‍රීසි අකුරු තුනෙන් එකක් හරි කිහිපයක් හරි තියෙනව. ඒ අකුරෙන් ඒ පාඨමාලාව දෙන මාධ්‍ය කියවෙනව. S = සිංහල, T = දෙමල, E = ඉංග්‍රීසි.

ප්‍රඃ තෝරගත්ත පාඨමාලා ඒකකයක් වෙනස් කරන්න පුලුවනිද? පුලුවනි නම් කවදට කලින්ද?

පිඃ පදනම් පාඨමාලා ඒකක අනිවාර්ය නිසා වෙනස් කරන්න බැහැනෙ.

අතිරේක පාඨමාලා ඒකකයකට ලියාපදිංචි වූ දින සිට මාස තුනක් ඇතුලත එය වෙනස් කළ හැකියි.

ප්‍රධාන විෂයට අදාළ පාඨමාලා ඒකක වෙනස් කිරීමට නොහැකිය. හේතුව දැනට තිබෙන විෂය නිර්දේශයෙහි සෑම මට්ටමකට ම අවශ්‍ය අවම පාඨමාලා දෙකක් පමණි ඇත්තේ. ඒ නිසා වෙනස් කරල ඒ විෂයෙන් තෝරගන්න වෙනත් පාඨමාලා ඒකකයක් නැහැනෙ.

ප්‍රධාන විෂය පාඨමාලා ඒකක නොව සම්පූර්ණ ම, ඒ කියන්නෙ ප්‍රධාන විෂය ම වෙනස් කරන්න අවශ්‍ය නම් 200 මට්ටමේ ආරම්භයේ දී එක වරක් පමණක් එක් විෂයක් පමණක් වෙනස් කළ හැකියි. එහෙම වෙනස් කළොත් අලුතින් තෝරගත්ත විෂයෙ 100 මට්ටමේ පාඨමාලා දෙකත් 200 මට්ටමේදි කරන්න ඕනැ. හැබැයි

එහෙමයි කියල එයාට විතරක් ඒ පාඨමාලා දෙකට විභාගයක් තියන්නෙ නැහැ. කේන්ද්‍රය 100 මට්ටමේ අනෙක් ළමයින්ට විභාග පවත්වන කොට ලියන්ඩ පුලුවනි. ඒ අලුතින් තෝරගත්ත විෂයෙ 100 මට්ටමේ පාඨමාලා ඒකක දෙක 200 මට්ටමේ දි අරගන්ඩ පුලුවන් උපරිම පාඨමාලා ඒකක 16 ට ඇතුලත් වෙන්නෙ නැහැ.

ප්‍රඃ අධ්‍යයනාරම්භය කල් දමා ගැනීම සහ නිවාඩු ලබා ගැනීම යන මේ දෙක අතර වෙනස මොකක්ද?

පිඃ අධ්‍යයනාරම්භය කල් දමා ගන්නේ පාඨමාලාව ආරම්භයේ දී 100 මට්ටම් විභාග ආරම්භවීමට පෙරයි. 100 මට්ටමේ විභාගවලට ඉල්ලන්නෙත් නැතිව අධ්‍යයනාරම්භය කල් දමා ගන්නෙත් නැතිව සිටියොත් ඉබේම ලියාපදිංචිය අවලංගු වෙනව. ගෙවපු මුදලුත් ආපසු ලැබෙන්නෙ නැහැ. ඒ නිසා ලියාපදිංචිය අවලංගුවීම වලක්වා ගැනීමට එක්කෝ පිළිගත හැකි හේතු ඉදිරිපත් කොට අධ්‍යයනාරම්භය කල් දමා ගැනීම කළ යුතුයි. නැතිනම් විභාගයට වාඩිවීමට අදහසක් නැතත් විභාග සඳහා අයදුම් කළ යුතුයි.

නිවාඩු ලබාගැනීම 200 නැතිනම් 300 මට්ටමේදි කරන්නෙ. ඒ අවස්ථාව වෙන විට පාඨමාලාවෙහි එක් අදියරක් සඳහා වත් පෙනී සිට ඇති හෙයින් නිවාඩු ලබාගැනීමේ ඉල්ලීමක් ඉදිරිපත් නොකොට විභාගවලට ද වාඩි නොවී සිටියත් ලියාපදිංචියේ අවලංගු වීමක් සිදු වෙන්නෙ නැහැ. එහෙත් ඒ මට්ටම්වල විභාගවලට පෙනී නොසිටින නිසා ‘අසම්පූර්ණ’ (I) ප්‍රතිඵලයක් ලැබේවි. එවිට එම විභාගවලට පසුව පෙනීසිටින විට ඒවා ‘නැවත පෙනීසිටීම්’ (Retakes) ලෙස සැලකෙන්නෙ. විභාගයකට නැවත පෙනී සිටිය විට කොච්චර හොඳට විභාගය කළ ත් උපරිම ප්‍රතිඵලය ලෙස ලැබෙන්නේ C+ පමණයි.

ප්‍රඃ වෛද්‍ය හේතු/ වෙනත් හේතු/ මේ හේතු දෙක ම මත හෝ ඉල්ලීමක් කරල කල් දිගුවක් ලබා ගැනීම (නිවාඩු ලබා ගැනීම) සහ සාමාන්‍ය කල් දිගුවක් ලබා ගැනීම (නිවාඩු ලබා ගැනීම) අතර වෙනස කුමක් ද?

පිඃ කලා අධ්‍යයන මණ්ඩලයට පිළිගත හැකි හේතු ඉදිරිපත් කොට නිවාඩු ලබා ගත් විට පංති සාමර්ථයට හිමිකම සහිතව නිවාඩුව ලැබීමට අවකාශ ඇත. සාමාන්‍ය නිවාඩු ලබාගැනීමක දී ඉල්ලීමක් නොකොට ලියාපදිංචිය අලුත් වීම සිදු වේ. ඒ සඳහා කලා අධ්‍යයන මණ්ඩලයේ හෝ වෙනත් කෙනෙකුගේ අනුමැතිය ද අවශ්‍ය නොවේ. එවිට ලැබෙන්නේ විභාගයට නැවත පෙනීසිටීමට අවසරය පමණි. හැබැයි ලියාපදිංචිය සක්‍රියව තියාගන්න ඕනැ.

ප්‍රඃ හදිසි කරදරයක් නිසා විභාගයට වාඩිවීමට බැරි උනොත් විතරද නිවාඩු ලබා ගන්ඩ අවශ්‍ය?

පිඃ නැහැ. නිසි අවසරය අරගෙන මට්ටම් තුනෙන් එක එක මට්ටම පුරාවට ම (සම්පූර්ණ මට්ටමට ම) පාඨමාලාවෙන් බැහැර වී සිටින්නත් පුළුවනි. **අධ්‍යයනාරම්භය** කල් දාගන්නෙ කොහොමටත් සම්පූර්ණ 100 මට්ටමෙන් ම පාඨමාලාවෙන් ඉවත් වෙලා ඉන්ඩ. ඒකට විවිධ හේතු ඉදිරිපත් වෙන්ඩත් පුලුවනි. උදාහරණ ලෙස විදේශගත වීමට සිදුවීම, ගැබ්බර වීම (මවක් වීමට අපේක්ෂාවෙන් සිටීම). අධ්‍යයනාරම්භය කල් දමා ගැනීමෙන් වෙන්නෙ පාඨමාලා ආරම්භය ප්‍රමාද වීම. ඒ නිසා සිදුවෙන අවාසිය උපාධිය සම්පූර්ණ කරන්ඩ ලැබෙන සම්පූර්ණ කාලයෙන් කල් දමා ගත් කාලය අඩු

වෙන එක විතරයි. අධ්‍යයනාරම්භය කල් දමා ගැනීම පංති සාමර්ථ්‍යට බලපාන්නෙ නැහැ.

දෙවෙනි තෙවෙනි මට්ටම් ආරම්භයෙදිත් ඉහත සඳහන් කළා වගේ සම්පූර්ණ මට්ටමෙන් ම පාඨමාලාවෙන් බැහැර වීමට සිදුවෙන මවක් වීමට අපේක්ෂාවෙන් සිටීම වැනි හේතු තිබුණොත් බැහැර වීමට අපේක්ෂා කරන කාලසීමාව පැහැදිලිව දක්වා නිවාඩු ලබා ගත යුතුයි. එවිට මට්ටමක් පුරා පැවැත්වෙන අනිවාර්ය සම්මන්ත්‍රණ ආදියෙනුත් බැහැර වීමට අවසර ලැබෙනව. නමුත් ඒව පසුව සම්පූර්ණ කළ යුතුයි.

හදිසි කරදරයක් නිසා විභාගයට වාඩිවීමට බැරි උනොත් ඒ වෙන කොට අනිවාර්ය සම්මන්ත්‍රණ ආදියට සහභාගි වෙලා තිබේ නම් පස්සෙ නැවත විභාගය කරන විට සම්මන්ත්‍රණ ආදියට ආපහු සහභාගි වෙන්ඩ අවශ්‍ය නැහැ. ආවරණ විභාගයකට ඉල්ලීමේ පහසුකමත් මෙහි තිබෙන බව අමතක නොකළ යුතුයි.

ප්‍රඃ 100 මට්ටම පුරාවටම නැතිව 100 මට්ටමේ විභාගයෙන් විතරක් නිවාඩු ගන්ඩ බැරිද?

පිඃ පුලුවනි. එතෙන්දිත් අධ්‍යයනාරම්භය කල් දමාගැනීමක් ලෙස ම තමා සැලකෙන්නෙ. නමුත් අනිවාර්ය සම්මන්ත්‍රණ ආදියට ඒ වෙන විටත් සහභාගි වෙලා තිබේ නම් ඉදිරියෙදි ආපහු ඒවට සහභාගි වෙන්න අවශ්‍ය නැහැ.

ප්‍රඃ 300 මට්ටමේ විභාග ප්‍රතිඵල පිට වුනාට පස්සෙ නැවත පෙනී සිටිය යුතු මට්ටම් තුනට ම අයිති පාඨමාලා ඒකක තිබුණොත් ඒවට නැවත පෙනීසිටින්න ඉල්ලීම් කරන්න ඕනැද? ඒ වගේ වෙලාවට ලියාපදිංචිය අලුත් කිරීමට අය කරන්නෙ කොහොමද?

පිඃ 300 මට්ටමෙන් පස්සෙ විභාගවලට නැවත පෙනී සිටින්න ඉල්ලීම් කරන්න අවශ්‍ය නැහැ. තමන් නැවත පෙනීසිටින පාඨමාලා ඒකකයට අදාළ විභාගයට අයදුම්පත් කැඳවන දින ගැන අවධානයෙන් ඉඳල විභාගයට ඉල්ලුම් කළ යුතුයි.

තමන් අයත් වෙන ශිෂ්‍ය කණ්ඩායම ලියාපදිංචි වූ දින සිට කේන්ද්‍රය පවත්වන සෑම 100 මට්ටමේ විභාගයක් ම තෙක් එක් අධ්‍යයන වර්ෂයක් ලෙස සැලකෙනව. වෙනත් ලෙසකින් කීවොත් ප්‍රයත්න ගණන් කිරීම ආරම්භ වෙනව. එහෙම ගණන් හදල ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු අයකෙරෙනු ඇත. තමන්ගෙ බැච් එක ලියාපදිංචි වූ දින සිට 100 මට්ටමේ විභාග 10ක් පවත්වා අවසන් වූ විට ඒ බැච් එකේ ළමයින්ගෙ ශිෂ්‍ය ලියාපදිංචිය ඉබේම අවලංගු වෙනව.

ප්‍රඃ නැවත පෙනීසිටිනවාදැයි තීරණය කිරීමට සැලකිය යුතු කරුණු මොනවාද?

පිඃ අසමත් වූ පාඨමාලා ඒකක විභාගවලට අනිවාර්යයෙන් නැවත පෙනීසිටිය යුතුයි. පෙනී නොසිටියොත් ඒ පාඨමාලා ඒකකයෙන් ලැබිය යුතු අර්ඝ නොලැබී ගොස් අවසානයේ උපාධියට අවශ්‍ය අර්ඝ 90 සම්පූර්ණ නොවී උපාධිය ලබා ගැනීමට නොහැකි වෙනව. පාඨමාලා ඒකකයකට අයත් අර්ඝ තුන ලබාගැනීමට අඩුම තරමින් D+ සහ D කියන දුර්වල සාමර්ථ දෙකෙන් එකක්වත් ලබා ගත යුතුයි.

'අසම්පූර්ණ' (I) ප්‍රතිඵලය ශ්‍රේණියක් නොවන නිසා එම ප්‍රතිඵලය සහිත පාඨමාලා ඒකක විභාග සඳහා ත් නැවත පෙනී සිටිය යුතුයි.

යම් පාඨමාලා ඒකකයකට ලැබී ඇති ප්‍රතිඵලය C+ ට වඩා අඩු නම් සහ එය C+ දක්වා වැඩි කරගැනීමට අවශ්‍ය වෙලාවටත් ඒ සඳහා ද නැවත පෙනීසිටිය හැකියි.

විශේෂයෙන් සැලකිය යුත්තක් නම් D+ සහ D යන දුර්වල සාමර්ථ ගොඩක් තිබෙන විට අවසානයේ උපාධිය සමත්වීමට අවශ්‍ය **සමස්ථ ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය වන 2.00** ලබා ගැනීමට අමාරු වෙනව. ඊට හේතුව D+ යනු 1.30 සහ D යනු 1.00 යන අගයන්ගෙන් යුක්ත වීමයි. එහෙයින් උපාධිය සමත්වීමට අවශ්‍ය සමස්ථ ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය වන 2.00 පවත්වා ගැනීමට දුර්වල සාමර්ථ හෙවත් D+ සහ D සහිත පාඨමාලා ඒකක විභාගවලට නැවත පෙනීසිටීම ප්‍රඥගෝචර වනු ඇත. C+ සඳහා 2.3 අගයක් ලැබෙන නිසා D+ සහ D C+ දක්වා වැඩි දියුණු කර ගැනීම ප්‍රඥගෝචරයි.

ප්‍රඃ මට්ටම් තුන ඇතුලත දුර්වල සාමර්ථයක් හෝ කිහිපයක් තිබුණොත් මට්ටම් තුන ම පළමු වාඩිවීමෙන් සමත් වුනත් පංති සාමර්ථයක් ගන්ඩ බැහැ නේද? මුල් මට්ටම්වල දුර්වල සාමර්ථ තියෙන පාඨමාලා ඒකකවලට දෙවෙනි මට්ටමේදි හෝ තුන්වෙනි මට්ටමේදි නැවත පෙනී සිටියොත් පන්ති සාමර්ථය ගන්ඩ බැරි වෙනවද?

පිඃ ප්‍රශ්න දෙකට ම පිළිතුර 'ඔව්' 'පුලුවනි' කියන එකයි. හැබැයි පන්ති සාමර්ථයට අවශ්‍ය සමස්ථ ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය 300 මට්ටම අවසන් වෙන විට අරගෙන තිබෙන්න ඕනැ. ඒ කියන්නෙ 3.00 ක් හෝ ඊට වඩා තියෙන්න ඕනැ.

හැබැයි මට්ටම් තුන ඇතුලත එක පාඨමාලා ඒකකයක් හරි අසමත් වුනොත් මට්ටම් තුන අවසානයේ සමස්ථ ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය 3.00 තිබුණත් පංති සාමර්ථයක් ගන්ඩ බැහැ.

ප්‍රඃ එක් පාඨමාලා ඒකකයකට කී වතාවක් නැවත පෙනී සිටිය හැකිද? ශ්‍රේණිය වැඩිකරගැනීමට නැවත පෙනී සිටි අවස්ථාවක කලින් තිබුණු ශ්‍රේණියට ද වඩා අඩු ශ්‍රේණියක් ලැබුණොත් මොකද වෙන්නෙ? නැවත පෙනී සිටීමට ඉල්ලුම් කරල විභාගයට නාවොත් මොකද වෙන්නෙ?

පිඃ නැවත පෙනී සිටිය හැකි වාර ගණන එම පාඨමාලා ඒකකය අයත් මට්ටම අනුව තීරණය වේ. 100 මට්ටමක දී එය 09කි. 200 මට්ටමේ දී එය 08කි. 300 මට්ටමේ දී එය 07කි. ඔබගේ 100 මට්ටමේ සිට ඉදිරියට ප්‍රයත්න සංඛ්‍යාව ගණනය කෙරෙන අතර ඒ අනුව උපාධිය සම්පූර්ණ කිරීම සඳහා සිදුකෙරෙන සෑම ලියාපදිංචිය අලුත් කරවා ගැනීමකට ම ගෙවීමක් සිදු කළ යුතු වේ.

පාඨමාලා ඒකකයක අවසන් ප්‍රතිඵලය ලෙස ගණන් ගන්නෙ ඒ පාඨමාලා ඒකකයට අරගෙන තියෙන ඉහල ම ප්‍රතිඵලයයි. ඒ නිසා නැවත පෙනී සිටි වෙලාවක කලින් තිබුණටත් වඩා අඩු ප්‍රතිඵලයක් ලැබුණත් ප්‍රශ්නයක් වෙන්නෙ නැහැ. අනෙක නැවත පෙනීසිටින විභාගයකට නාවත් ප්‍රශ්නයක් නැහැ මොකද ඒ විභාගෙට කලින් අරගෙන තියෙන හොඳම ප්‍රතිඵලය තමා අවසානෙදි ගණන් ගැනෙන්නෙ.

ප්‍රඃ එක එක මට්ටමේ දි පෙනී සිටිය හැකි උපරිම පාඨමාලා ඒකක විභාග සංඛ්‍යාවක් තියෙනවද? ඒ ගැන විස්තරයක් කරන්න පුලුවනිද?

පිඃ තියෙනව. 100 මට්ටමේ දි පාඨමාලා ඒකක 12යි; 200 මට්ටමේ දි 16යි; 300 මට්ටමේ දි 14යි.

100 මට්ටමේ ඉන්නකොට කැමති නම් 200 සහ 300 මට්ටමෙන් පාඨමාලා ඒකක දෙකක් ඒවයෙ විභාග තිබෙන කොට කරන්න පුලුවනි.

200 මට්ටමේ දි ඒ මට්ටමට නියමිත පාඨමාලා ඒකක 10ට අමතරව තව පාඨමාලා ඒකක 6ක් කරන්න පුලුවනි. ඒ 6 ට 100 මට්ටමේ 'නැවත පෙනීසිටින' පාඨමාලා සහ 300 මට්ටමේ පාඨමාලා ඒකකත් ඇතුල්වෙන්න පුලුවනි.

300 මට්ටමේ දි ඒ මට්ටමට නියමිත පාඨමාලා ඒකක 10 ට අමතරව තව පාඨමාලා ඒකක 4ක් කරන්න පුලුවනි. ඒ 4 ට 100 මට්ටමේ සහ 200 මට්ටමේ 'නැවත පෙනීසිටින' පාඨමාලා ඒකක ඇතුලත් වේවි.

තමන් ඉන්න මට්ටම තීරණය වෙන්නෙ තමන් අයත් වෙන උපාධි පාඨමාලා ශිෂ්‍ය කණ්ඩායම (බැච් එක) සඳහා cdce එක විභාග පවත්වන ආකාරය අනුවයි. පිළිගත හැකි වෛද්‍ය හෝ වෙනත් හේතු මත බැච් එක මිස් වුනොත් හැර මට්ටම තීරණය කරන්නෙ මේ ක්‍රමවේදයටයි.

මෙම පෙනී සිටිය හැකි උපරිම පාඨමාලා ඒකක ගණනට අර්ස රහිත පාඨමාලා ඒකක ඇතුලත් නොවේ. ශිෂ්‍යයන්ට තමන් කැමති ඕනෑම මට්ටමකින් ඕනෑම පාඨමාලා ඒකක ප්‍රමාණයක් (එම විභාග පැවැත්වෙන විට) අර්ස රහිත පාඨමාලා ඒකක ලෙස හැදෑරිය හැකිය. මෙම අර්ස රහිත පාඨමාලා ඒකකයන්හි ප්‍රතිඵල උපාධිය සඳහා ගණන් ගනු නොලැබේ. නමුත් ප්‍රතිඵලය ප්‍රතිලේඛනයට අර්ස රහිත පාඨමාලා ඒකක ලෙස ඇතුලත් කරනු ලැබේ.

ප්‍රඃ ශ්‍රේණි ප්‍රමිතිකරණය යනු කුමක්ද?

පිඃ ශ්‍රේණි ප්‍රමිතිකරණය යනු යම් පාඨමාලා ඒකකයක විභාගයක දී විභාගාපේක්ෂකයන් ලබාගෙන ඇති ලකුණු සමස්ථය විශ්ලේෂණය කොට පිළිගත් අධ්‍යාපන ක්‍රමවේද අනුව ශ්‍රේණිගත කිරීමයි. මෙහි දී ශ්‍රේණිකරණයෙහි ඇතුලත් E සිට A දක්වා ශ්‍රේණි සියල්ලෙහි ලකුණු පරාසය තීරණය කරනු ලැබේ.

මෙයින් බලාපොරොත්තු වන්නේ එක ම විෂය නිර්දේශයකට එක් එක් අවුරුදුවල කිහිපවිටක් විභාග පැවැත්වෙන විට ප්‍රශ්න පත්‍ර අතර පැවතිය හැකි විෂමතා, උත්තර පත්‍ර බැලීම සඳහා පරීක්ෂකවරුන් විශාල සංඛ්‍යාවක් සහභාගි වෙන විට ඇතිවන විෂමතා අවම කරගෙන වඩාත් සමබර සහ නිවැරදි ඇගයීමක් සිදුකිරීමයි.

ප්‍රඃ පේරාදෙණියෙන් පිටත විභාග මධ්‍යස්ථානවල විභාගෙ තියන්නෙ නැතිද?

පිඃ ප්‍රමාණවත් ළමයි ගණනක් හිටියොත් තියනව.

ප්‍රඃ ප්‍රතිඵල නිකුත් කරන්ඩ කොච්චර කල් යනවද?

පිඃ විභාගය අවසන් වෙලා මාස 3 - 4 ඇතුලත ප්‍රතිඵල දෙන්ඩ හැකි උපරිමයෙන් උත්සාහ කරනව.